# කැන්ගරු දේශයේ හුදකලා වූ සුප්පා දේවිය.

ආනන්ද සමරතුංග

බ්‍රිස්බේන්




පසුගිය පෙබරවාරිමස 1 වෙනි දින බොරැල්ලෙහි පුංචි තියටර් වෙත එක්රොක් වූ කලා රසිකයන්ගෙන් ශාලාව පිරී ඉතිරී තිබුනා මෙන්ම, වෙනදා එක් රොක් වන ප්‍රේක්ෂකයන්ට වඩා මේ අයගේ යම් වෙනසක් විය. ඔවුන් ලංකාවේ දැනට සිටින දක්ෂතම, සම්භාවනීය නාට්‍ය ශිල්පීන්, ශිල්පිනියන්, ගායක, ගායිකාවන්, මහාචාර්ය වරුන් , සංගීතඥයන්, වේශනිරූපන ශිල්පනී ආදී උගත්, බුද්ධිමත් පිරිසක් විය. විශේෂයෙන්ම මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ නිර්මාණ වලට බොහෝසේ ඇලුම් කරන පිරිසකි.

මොවුන් මේ එක්වූ සුන්දරවූත්, අපූර්වවූත් සැන්දෑව '' නැත ලොවේ අන් රසදුනා'' වේදිකා නාට්‍ය ගීත සංයුක්ත තැටිය දොරට වැඩුමයි. දර්ශන වාර 5000 කට වඩා දායකත්වය සපයා දශක 3කට අධික කාලයක් පමණ එකම වේදිකා නාට්‍යයක රඟපා ලෝක වාර්තාවක් ලෙසින් ගිනස් වාර්තා පොතට ඇතුලත් වූ සිංහබාහු හි සුප්පා දේවිය නැතහොත් සිංහල වේදිකා නාට්‍ය ඉතිහාසයේ ප්‍රමුඛ කාන්තා චරිත අතර ඉහලින්ම වැජඹෙන මාලනී රණසිංහයන් විසින් මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ වේදිකා නාට්‍ය ගීත 16 ක් අඩංගු සංයුක්ත තැටිය දොරට වැඩුමයි.

මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ ආදාහනොත්සවය දා මහාචාර්ය කාලෝපොන්සේකා මෙසේ ප්‍රකාශ කරන ලදී. ''ඉර හඳ පවතින තුරු, සීගිරි කාල කූඨය වැජඹෙන තුරු, තිසා වැවේ සීතල සුලඟ මුසුවනතුරු මනමේ, සිංහබාහු සදාකල් වැජඹෙනු ඇත.

සිංහබාහු නාට්‍යයෙහි රංගනයෙන්, ගායනයෙන්, අභිනයෙන් සිය ආධිපත්‍ය පතුරවා සිටින්නී අන් කවරෙකු නොව සුප්පා දේවිය බව නාට්‍ය නැරඹූ කිසිදු රසිකයෙකුට අමුතුවෙන් සිහිපත්කොට දියයුතු නැත. ඇය අද ක්වීන්ස් ලන්තයේ බ්‍රිස්බර්න් නුවර සිය එකම දියණිය මුණුපුරා සහ මිණිපිරිය සමග විවේකීව සිටින්නීය.

**ඇයි ඔබට මේ වගේ සංයුක්ත තැටියක් කරන්නට හිතුනෙ?**

''ජීවිතයේ සැඳෑ සමය නිසාත්, ලෝකයට වැදගත් යමක් ඉතුරුකල යුතුයි කියා සිතුනා. ඒ වගේම අනාගත පරම්පරාවට උසස් යමක් රසවිඳින්න අවස්ථාව ලබා දීමත් මගේ පරමාර්ථය උනා.''

**විශ්ව විද්‍යාලයේ නවකවදය අනෙක් අයගේ ජීවිත වලට බලපෑ අයුරින් නොවෙයි ඔබට බලපෑවේ එය ඔබට ආශිර්වාදයක් පැළනා කීවොත් එය නිවැරදිද?**

'' මහනුවර උසස් බාලිකා විද්‍යාලයෙන් විද්‍යා අංශයෙන් ඉගෙනුම ලබලා 1961 දි පේරාදෙනිය විශ්ව විද්‍යාලයට ඇතුලත් වුනා. එම අවස්ථාවේදී මම රුක්මනි දේවියගේ ගීතයක් ගායනා කලා. මේ සිද්ධිය කෙසේ හෝ මහාචාර්ය තුමාට ආරංචි වෙලා එතුමා මේ වන විටත් සිංහබාහු පටන් අරන් පුහුණුවීම් කරගෙන යනවා. ප්‍රධාන නිළි චරිතයට කෙනෙක් සොයමින් සිටින අවස්ථාවක් ඉතා උසස් ගායන හැකියාවක් තිබෙන කෙනෙක් තමයි හොයල තියෙන්නෙ. මහාචාර්යතුමාගෙන් මට පණිවුඩයක් ලැබුනා එන්න කියලා එතුමා ලඟට මාව රැගෙන ගියේ එවකට නාට්‍ය අනු මණ්ඩලයේ ලේඛම්ව සිටි තරුණ උපාධි අපේක්ෂකයෙක් වූ ටෙරන්ස් රණසිංහ විසිනි. ඇත්ත වශයෙන්ම මේ සිද්ධීන් දෙකම මගේ ජීවිතයේ ලොකු වෙනසක් කලා. නවක වදයෙදී ගිතයක් ගායනය කල නිසා මහා යුගපුරුෂයාණන් වූ සරච්චන්ද්‍රයන්ගේ නිර්මාණ වලට දායක වෙන්න අවස්ථාව ලැබුනා මෙන්ම එතුමා වෙත මා රැගෙන ගිය ටෙරන්ස් මගේ ජීවිතයේ අනාගත සහකරුවාද වුනා ''

**මහාචාර්ය සරච්චත්ද්‍රයන්ගේ නිර්මාණ වලට දායකවීම හා එතුමාගේ නිර්මාණ ශක්තිය කොහොමද ඔබ දකින්නෙ?**

'' ඇත්තටම මේ අවස්ථාව මගේ ජීවිතයට ලැබුණු ලොකුභාග්‍යක්, වාසනාවක් සියලු උගතුන්ගේ හා වියතුන්ගේ අදහස් හා විචාර අනුව එතුමන්ගේ සියළු නාට්‍ය අතරින් සිංහබාහු උච්චතම ස්ථානයේ වැජඹෙනවා එතුමා වැන්නවුන් ලෝකයට පහළ වන්නේ ජාතියේ පිනට කල්පයකට වතාවක් පමණයි.

ඒ වගේම සිංහබාහු වැනි නාට්‍යක් අන් කවරදාක වත් කවරෙකු හෝ අතින්වත් බිහිවේ යැයි සිතන්නට අමාරුයි. කිරම ධම්මානන්ද හිමි විසින් රචිත ''සියබස් මල්දම '' නම් කෘතියෙන්ද පිලිප්පු සිඤ්ඤෝ අතින් රචිත ''සිංහවල්ලි'' කෘතියෙහිද අඩංගු වන්නේ මහා වංශයේ හා ජනශ්‍රැතියේ ඇති සිංහලයාගේ උත්පත්තිය පිළිබඳ පුරාවෘතියයි. එහෙත් පෙර අපර දින දර්ශන උගත් බුද්ධිමය මාධ්‍යකරුවෙකු මෙන්ම රවීන්ද්‍රනාත් තාගෝර් වැන්නවුන්ගේ ඇසුරෙන් ලබාගත් භාරතීය රංගධාරි සංගීත ඥාණයෙන්ද පිරිපුන් උප ඇදුරු තුමා සතු මහාඥාන ශක්තිය, ගැඹුරු දර්ශනය හා දැනුම නිසාත් එතුමා සතු විචිත්‍ර, ලාලිත්‍යමය, කාව්‍යමය බස්වහර නිසාත් එම පුරාවෘත්තිය එතුමා අතින් ප්‍රතිනිර්මාණය වුනේ පුරාණයේ මෙන් කතාවක් කියා පෑමක් ලෙස නොව මනුෂත්වයට පොදු වූ දෘෂ්ඨියකින් කෙරුණු විවරණයක් ලෙසින්

සංකීර්ණ මානව සම්බන්ධතා පිලිබඳ මනා අවබෝධයකින්යුතු පසු බිමක සිට රචිත මෙම නාට්‍යයෙහි භූමිකා සංකීර්ණ තලයකට ඔසවා තබමින් අතිශය ප්‍රභල නාට්‍යමය අවස්ථා මතු කරමින් ඉතා තියුණු රසවින්දනයක් ලැබිය හැකි සදාතනික ගුණයෙන් හෙබි උත්කෘෂ්ඨ කළා කෘතියක් තමයි සිංහබාහු. ඉතින් එවැන්නක භූමිකාව මා හට ලැබීම සත්තකින්ම මාගේ වාසනාවක් ලෙස මම හිතන්නෙ.

එපමණක් නෙමෙයි සංහබාහු නාට්‍යයේ රගපෑමට අවස්ථාව ලැබු අප සෑම දෙනාටම මහා වාසනා ගුණයක් ඇතිව මෙලොව ඉපදුනා වු භාග්‍යවන්තයෝ වෙමු. මුලින්ම උපතින් ගෙනා යම් දෙයක් හේතුවෙන් ඉවෙන් මෙන් පියපතෙහි ඇති විශිෂ්ඨ භාෂාවෙන් හෙබි පද වැල් වල අර්ථය තේරුම් ගෙන රංගනයට අවතිර්නය වු අපි සැවොම මෙවන් මාහාපුරුෂයකු ඇසුරින් හා උපදෙස් ලබමින් අපගේ ප්‍රතිභාවන් තවතවත් ලියවා ඔප්නංවා ගත්තෙමු, අන්කවර රංගන ශීපියෙකුට හෝ ශිල්පනියකට නොහැකි වු දීර්ඝ කාලයක් එනම් වසර 32 කට ආසන්න කාලයක් එතුමන්ගේ කෘති වල දිගටම රංගනයේ යෙදෙමින් එතුමාගේ ඇසුරෙහි හා සෙවණෙහි හිද ගුරහරුකම් ලබමින්ද මහස්පෝෂණයට පින් ලැබු ඒ සෑමදෙනා අතරින් වඩාත් භාග්‍යවන්තිය වී ඇත්තෙමි. විද්‍යා උපාදියක් ලැබිමට පේරාදෙනිය වශ්ව විද්‍යාලයට ඇතුල් වී ඇදුරු තුමාගේ හා සිංහබාහු, මනමේ, වෙස්සන්තර ආදී නාට්‍ය ඔස්සේ ලබාගත් පෝෂණයෙන් මට දැනුනේ මා එකවර උපාධි දෙකක් ලබා ගැනිම තරම් වරම් ලැබු ලෙසියි.

**සිංහබාහු නාට්‍යයේ ඔබව වේදිකාවට කැදවන්නේ පොතේ ගුරු විසිනි. එනම් ආදරබර සැමියා ටෙරන්ස් රණසිංහ විසිනි. මේ හැගිම කෙබදුද?**

පොතේ ගුරු වශයෙන් මා වේදිකාවට ටෙරන්ස් කැදවද්දි හිතට මහා ලොකු ශක්තියක් දැනෙනවා. වර්ෂ 30 ක් එක දිගට එයද මගේ ජිවිතයේ විස්තර කරන්නට අමාරු සතුටක්.

පසුගිය පෙබරවාරි මස 1 වැනිදා ලංකාවේදී පැවති '' නැතලොවේ අන් රසදුනා '' මගේ සංයුක්ත තැටිය දොරට වැඩුම උත්සවයේ දී මූලිකව මා වටා සිටි ලලිතා සරච්චන්ද්‍ර මැතිනියටත්, බුද්ධදාස ගලප්පත්ති හා ජයලත් මනෝරත්න ඇතුළු විශාල පිරිසක් මගේ සදාතනික මතකයේ සනිටුහන් වෙලා තියෙනවා මම ආනන්ද මේ අවස්ථාව උපයෝගී කරගන්නවා ඒ සියළු දෙනාට ස්තූති කරන්න

*තම සැමියා සමග දර්ශණ වාර 5000 ක් පමණ වේදිකාවේ රගපා නිවසේදීත් තම සැමියා හා දරුවන් දෙදෙනා සමග ගත කළ ඒ ගෘහ ජීවිතයද මාලනී රණසිංහයන් සිහි කරන්නේ ඉතා සතුටිනි. තම සැමියා වේදිකාවෙන් සමුගත් පසු තමන්ද වේදිකාවෙන් සමුගත් බවත් ආදරණීය ටෙරන්ස් පසුගියදා ජීවිතයෙන්ද සමුගත් අතර අද තම පුතු ඉංජිනේරු අංශයේ මහාචාර්යවරයෙකු ලෙස නෙදර්ලන්තයේද දියණිය වෛද්‍යවරියෙක ලෙස බ්‍රිස්බන් නුවර ජිවත් වන අතර අද දින දියණිය සමග බ්‍රිස්බර්න් නුවර දිවි ගෙවන අතර බ්‍රිස්බන් නුවර සිංහල සංස්කෘතික වැඩ කටයුතු වලට සහභාගි වන අතර මැයි මස 25 වන දින මාලනී රණසිංහයන් වෙනුවෙන් බ්‍රිස්බන් නුවර 4EB ගුවන් විදුලියේ ශ්‍රී ලාංකික කණ්ඩායම විසින් උපහාර උළෙලක් සංවිධානය කර ඇත.*

## සම්මාන පිට සම්මාන දිනූ "සුද්දා" ඕස්ට්‍රේලියාවේ !!

### සුද්දෙක් සිංහලෙන් කතා කරනවා ඔබ කවුරුත් දැක තිබෙනවාද?



සුද්දෙක් සිංහලෙන් කතා කරොත් අපි ගැන මොන කියාවිද? ඒ විතරක් නෙවෙයි අපි අතර සිංහල සුද්දෝ කොච්චර ඉන්නවද? මේ ඔක්කොම දේවල් දැනගන්නත් හාස්‍යයෙන් පිරි අරුත් බර වේදිකා නාට්‍යයක් රස විදින්නත් ඔබට මැයි මාසයේ පුළුවන්.

රාජ්‍ය නාට්‍ය උළෙලේ **හොඳම පිටපත , හොඳම සංගීතය සහ හොඳම නිළිය** සම්මානයන්ගෙන් පිදුම් ලද උදයසිරි වික්‍රමරත්නයන්ගේ "සුද්දෙක් ඔබ අමතයි" වේදිකා නාට්‍ය පිලිබඳවයි මේ පෙර සටහන.

මෙල්බෝර්න් (මැයි 24), බ්‍රිස්බෙන් (මැයි 25), පර්ත් (මැයි 30), ඇඩිලේඩ් (මැයි 31), සිඩ්නි (ජුනි 1 ) යන ඕස්ට්‍රේලියාවේ ප්‍රදාන නගර 5කම මෙම නාට්‍ය ප්‍රදර්ශනය වෙනවා.

ජයලත් මනෝරත්න , මාදනී මල්වත්තගේ සහ නලින් ප්‍රදීප් උඩුවෙල වැනි ජනකාන්ත ප්‍රවීණ රංගන ශිල්පීන් ගණනාවක් මේ වේදිකා නාට්‍යයේදී ඔබට දැක ගන්නට පුළුවන්. ඉතිහාසය සහ වර්තමානය ගැන ජයලත් මනෝරත්න තමන්ටම අවේනික උපහාසාත්මක හාස්‍යජනක ශෛලියකින් කතාකරද්දි නලින් ප්‍රදීප් තමයි සුද්දාගේ චරිතයට පන පොවන්නේ. ස්ත්‍රියක් මේ ගැන දකින විදිහ මාදනී නිරූපණය කරන්නේ.

**මේ වනවිට "සුද්දා" ලංකාවේ දර්ශන වාර 120 කට වඩා රඟ දක්වල තියෙනවා.**

කාලෙකට පස්සේ ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන නගර සියල්ලේම පෙන්වන මේ අරුත්බර නාට්‍යය රස විදින්න පවුලේ සැවොම සමග එක්වෙන්න කියල සියලු දෙනාටම අපි ගෞරවයෙන් ආරාධනා කරනවා.

